2009 ජූනි

රු: 50.00

# බිම්නෙත

බිම්නෙත ද්වි මාසික සඟරාව මානුෂීය සේවායතන සමූහය විසින් පහසුකම් සලසන සිවිල් සමාජීය මෙහෙවරකි.

ද්වි මාසික සඟරාව

2 වෙළුම 3 කලාපය



**සංවර්ධනය නාමයෙන් පැල්පත්වාසීන් අවතැන් විය යුතුද?**

පිට - 09

**ජීවිතයට එළිය අහිමි ඉරුදෙණියායේ මිනිස්සු**

පිට - 17

## මහවිලච්චිය:



## විශ්ව ගම්මානයේ අපේ ගම



**දිනෙන් දින බොඳ වන රජරට වෙද විදුහල් සිහිනය**

පිට - 20

**උතුරට කිරි උතුරන මඟ**

පිට - 24



# මහවිලච්චිය:
# විශ්ව ගම්මානයේ අපේ ගම

1998 වසරේ සිට තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය සහ ඉංග්‍රීසි අධ්‍යාපනයෙන් මහවිලච්චියේ ළමයිනට සේවය සලසමින් සිටි හොරයිසන් ලංකා ආයතනය, තොරතුරු තාක්‍ෂණයේ ප්‍රතිලාභ ළමයිනට පමණක් නොව ගම් වැසියනට ද ලබා දිය හැකි නව මං සොයමින් සිටියේ ය. අතීතයේ දී අවිධිමත් පරිගණක පාඩම්, ක්ෂේත්‍ර චාරිකා, කොළඹ පැවති තොරතුරු තාක්‍ෂණ ප්‍රදර්ශන ආදියට හොරයිසන් ලංකා ආයතනය මව්පියන් ද සම්බන්ධ කර ගත් නමුත් විධිමත් හා සංවිධානාත්මක ලෙස ගැමියන් ක්‍රියාකාරී ලෙස තොරතුරු තාක්‍ෂණය සඳහා සහභාගි කර ගැනීමක් සිදු නොවිණි.

හොරයිසන් ලංකා සේවක මණ්ඩලය විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ දේශීය තොරතුරු තාක්‍ෂණ විශේෂඥයන් සමඟ පැවැත්වූ දීර්ඝ සාකච්ඡාවලින් පසුව 'ඊ - ගම්මාන' සංකල්පය 2004 දී බිහිවිණි.

**හොරයිසන් ලංකා නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරී නන්දසිරි වන්නිනායක**



'ඊ - ගම්මාන' වැඩසටහනේ මූලික අදහස වූයේ තොරතුරු තාක්‍ෂණයේ ප්‍රතිලාභ යොදා ගනිමින් මහවිලච්චිය ප්‍රජාවගේ ධනාත්මක සංවර්ධනයක් ඇති කිරීම යි. වැඩසටහන සඳහා ආකර්ශනීය නමක් සොයමින් සිටි අවස්ථාවේ දී IDM සමූහ ව්‍යාපාරයේ සභාපති ආචාර්ය බන්දු රණසිංහ මහතා හොරයිසන් ලංකා ආයතනයට සපැමිණ සැලසුම් කළ වැඩසටහන අධ්‍යයනය කිරීමෙන් පසු ඒ සඳහා ''ආදර්ශ ඊ-ගම්මානය'' නම ඔහු යෝජනා කළේ එය සම්පූර්ණ වැඩසටහන අර්ථ ගැන්වූ නිසා ය.

ආදර්ශ ඊ-ගම්මාන වැඩසටහන 2005 ජනවාරි මස නිල වශයෙන් හොරයිසන් ලංකා මඟින් ආරම්භ කෙරිණි. ඉන් බලාපොරොත්තු වූයේ තොරතුරු තාක්‍ෂණය සහ අන්තර්ජාල පහසුකම් ගමේ නිවාස සහ පරිගණක මධ්‍යස්ථානවලට ලබා දෙමින්, ගැමියන් තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීමට පෙලඹවීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට උනන්දු කිරීම යි.

වැඩසටහනේ දීර්ඝකාලීන තිරසාරත්වය පියවරින් පියවර ලබා ගැනීමට හොරයිසන් ලංකා ආයතනයේ බලාපොරොත්තුව විය.

ඊ-ගම්මාන වැඩසටහනේ මුල් ම පියවර වූයේ ප්‍රජාවගේ සහාය ලබා ගැනීම යි. ගැමි ප්‍රජාවගේ සහාය මෙවැනි වැඩසටහනක සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය බව හොරයිසන් ලංකා ආයතනය හොඳින් දැන සිටි නිසා ඒ වන විටත් ආයතනය සහ ප්‍රජාව අතර ගොඩනැඟී තිබූ බැඳීම් තවදුරටත්

ශක්තිමත් කර ගැනුණේ පාසල්, පන්සල්, පොලිස් බලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් ආදීන් ද වැඩසටහන හා සම්බන්ධ කර ගනිමිනි.

තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය ( ICTA ) මඟින් ප්‍රදානය කළ අමෙරිකා ඩොලර් 10, 000 කට ආසන්න වටිනාකමකින් යුත් අරමුදලෙන් ලබා ගත් උපකරණ සවි කිරීම අනතුරුව සිදු විය. මෙම ප්‍රදානය මඟින් මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් පද්ධතිය සහ මයික්‍රොසොෆ්ට් ඔෆිස් ස්ථාපනය කළ පරිගණක 5 ක් හොරයිසන් ලංකා ආයතයට ලැබිණි. ඊට අමතරව මාසික අන්තර්ජාල බිල ද නියෝජිතායතනය විසින් අද දක්වාම ගෙවනු ලබයි. හොරයිසන් ලංකා ආයතනයේ සේවකයන් දෙදෙනකු ඉන්දියාවේ චෙන්නායි නුවර අධ්‍යයන සංචාරයකට යැවුණේ ද මෙම ප්‍රදානයේ කොටසක් ලෙස ය.



IDM ආයතනයේ උදවු ඇතිව ''පුහුණුකරුවන් පුහුණු කිරීමේ'' පාඨමාලාවක් සඳහා සිවු දෙනකු හොරයිසන් ලංකා මඟින් IDM වෙත යැවිණි. තොරතුරු තාක්‍ෂණය ප්‍රජාවට සම්ප්‍රේෂණය කිරීමට මේ පුහුණුව මඟින් අනගි පිටිවහලක් ලැබිණි.

ප්‍රජාවට තොරතුරු තාක්‍ෂණය භාවිතය හුරු කිරීම සඳහා හොරයිසන් ලංකා ආයතනය මඟින් වැඩමුළු මාලාවක් ආරම්භ කෙරිණි. ඒ සඳහා ප්‍රජාවගේ උනන්දුව වැඩි වන විට ආයතනය මඟින් වැඩිදුර තොරතුරු තාක්‍ෂණ අධ්‍යයන පාඨමාලා පවා ගමේ ආයතනවලට ලබාදීම සිදු විය. උදාහරණයක් ලෙස ඉතාමත් පහසුවෙන් සහ ඉක්මනින් කෘෂිකාර්මික තොරතුරු, කාලගුණ අනාවැකි, කෘෂි නිෂ්පාදන මිල ගණන් සහ වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට දුන් මහවිලච්චිය ගොවියාට පුළුවන. අස්වැන්න නෙළිය යුත්තේ කුමන වේලාවට ද, අස්වැන්න විකිණිය හැක්කේ කුමන මිලකට ද යන්න තීරණය කිරීම සඳහාජ ප්‍රජාව මේ තොරතුරු භාවිත කරයි.

රැකියා විරහිත අයට ආයතනයේ බහු මාධ්‍ය පුස්තකාලය සහ අන්තර්ජාල පහසුකම් භාවිත කිරීමෙන් රැකියා අවස්ථා ලබා ගැනීමේ ඉඩප්‍රස්තා පුළුල් කර ගත හැක. ආයතනයේ පුහුණු සැසිවල දී අන්තර්ජාලය ඔස්සේ නිවසේදී ලබා ගන්නා තොරතුරු තාක්‍ෂණ දැනුම උපයෝගී කර ගනිමින් රැකියා වෙළෙඳපොළේ වැඩි ඉල්ලුමක් ලබා ගැනීමට රැකියා විරහිතවූවනට අවස්ථාව ලැබී තිබේ.

ගැමියන් සහ ලෝක ප්‍රජාව අතර සම්බන්ධය වැඩි දියුණු වී ඇත්තේ අන්තර්ජාලය මඟින් ඊ-මේල් සහ ස්කයිප් SKYPE වැනි සම්පූර්ණයෙන් ම නොමිලේ ලැබෙන සන්නිවේදන ක්‍රමවලට පින්සිදු වන්නට ය. හොරයිසන් ලංකා ආයතනය මඟින් ආරම්භ කළ 'ඊ-ගම්මාන' වැඩසටහනේ සාර්ථකත්වය මැණීමට හොඳම සාධකයක් වන්නේ ඒ හරහා ගැමි දරු දැරියන් පරිගණක වෘත්තිකයක් බවට පත් කිරීම ය. ගමේ පාසල්වල පහසුකම් හිඟකම නිසාම තොරතුරු තාක්‍ෂණය වැනි විෂයයන් හැදෑරීමට ළමයිනට අවස්ථාව අහිමි වී යයි. නමුත් හොරයිසන් ලංකා ආයතනය මඟින් ලබා දෙන පරිගණක සහ අන්තර්ජාල පහසුකම් නිසා දුන් ගැමි දරුවනට නාගරික දරුවනට මෙන් ම අවස්ථා උදා වී ඇත. ආයතනය මඟින් ගමේ රජයේ පාසල්වලට ද ලබා දී ඇති අන්තර්ජාල පහසුකම් නිසා විශාල ගැමි දරුවන් පිරිසකට ටොරතුරු තාක්‍ෂණ මාවත විවර වී ඇත.

මහවිලච්චිය ග්‍රාමීය රෝහලේ ප්‍රයෝජනය සඳහා හොරයිසන් ලංකා ආයතනය මඟින්, පාවිච්චි කළ පරිගණකයක් ලබා දුන් අතර නුදුරු අනාගතයේදී ම රෝහලට අන්තර්ජාල පහසුකම් ලබාදීමට ද ආයතනය බලාපෙරොත්තු වෙයි. තොරතුරු තාක්‍ෂණය භාවිතය මඟින් රෝහලේ ලේඛන කටයුතු කාර්යක්‍ෂම කර ගැනීමට හැකිවී ඇත. රාජ්‍ය අනුග්‍රහය සහ අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබුණහොත් මහවිලච්චිය ග්‍රාමීය රෝහල නාගරික රෝහලක් සමඟ සම්බන්ධ කර ටෙලිමෙඩිසින් ( tele medicinε ) ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ද හොරයිසන් ලංකා ආයතනය බලාපොරොත්තු වෙයි.

අන්තර්ජාල බැංකු සේවා ප්‍රචලිත වීම නිසා, ගැමියන් ගමනාගමනය සඳහා වැය කළ කාලය සහ මුදල් ඉතිරි කර ගැනීමට ද සමත් වී ඇත. හොරයිසන් ලංකා ආයතනය මඟින් ලබා දී ඇති අන්තර්ජාල පහසුකම් නිසා ගැමියනට නිවසේ සිටම බැංකු කටයුතු කර ගත හැක.

තොරතුරු සම්ප්‍රේෂණය සඳහා ක්‍ෂණික ක්‍රියා මාර්ග නොමැතිවීම නිසා අතීතයේ දී ජාතික ආපදාවලදී තොරතුරු ලබා ගැනීම අපහසුව පැවැතිණි. වර්තමානය වනවිට ග්‍රාමීය ජනතාවට ද තොරතුරු තාක්‍ෂණට හඳුන්වා දීමෙන් ඉහත අවස්ථාවල දී විවිධ ආයතන වෙත සේවා සැලසීමට පහසුවී



ශ්‍රී ලංකාවේ අමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් ලද 486 වර්ගයේ පරිගණකය.



අන්තර්ජාලය ගෙදරට ම

ඇත. තොරතුරු තාක්ෂණ ග්‍රාමීය ජනතාවගේ හුදෙකලා බව අඩුකර ඔවුන් ද රටේ සෙසු ප්‍රදේශයන්හි සිදුවීම් සමඟ සම්බන්ධ කළ හැකිව තිබේ.

ආදර්ශ 'ඊ-ගම්මාන' වැඩසටහනේ වෙනත් ප්‍රතිලාභ

1. බහුමාධ්‍ය පුස්තකාලය:

පොත්, පුවත්පත්, වාර සඟරා, වීඩයෝ CD, ඩීවීඩී, බාගත කළ දත්ත ඇතුළත් CD සහ කැසට් පට මාර්ගයෙන් ග්‍රාමීය ප්‍රජාවට සහ ව්‍යාපාරිකයනට තොරතුරු ලබා ගැනීමට හොරයිසන් ලංකා ආයතනය ඉඩ සලසා ඇත. මෙම බහුමාධ්‍ය පුස්තකාලයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙස ආයතනය අධ්‍යාපනඥයන් ගෙන්, පර්යේෂකයන් ගෙන්, වෘත්තිකයන් ගෙන් සහ පරිත්‍යාග ශීලීන් ගෙන් ඉල්ලා සිටියි.



2.සන්නිවේදනය:

මහවිලච්චියට ප්‍රථම ජංගම දුරකතන ජාලය ගෙන ඒමට හොරයිසන් ලංකා ආයතනයට හැකි විය. මේ වනවිට ජංගම දුරකථන සේවා ජාල හතරක් සහ සී. ඩී එම්. ඒ. දුරකථන සේවා ජාල හතරක් මහවිලච්චියේ ක්‍රියාත්මක වෙයි. මෙයට අමතරව හොරයිසන් ලංකා ආයතනය මඟින් පරිගණක විද්‍යාගාරයට සහ ගමට මෙෂ් ( mesh ) තාක්ෂණය මඟින් අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත.

3.ඩිජිටල් ඡායාරූපකරණය:

'ඊ-විලේජ්' කණ්ඩායම මඟින් ලබා දෙන තවත් සේවාවක් වන්නේ ඩිජිටල් ඡායාරූපකරණ සහ ග්‍රැෆික් නිර්මාණයයි. දේශීය සහ විදේශීය ඇණවුම් මත ගැමි දරුවන්ගේ හැකියාවනට මිලක් ලබා ගැනීමට මේ මඟින් හැකි වී ඇත.

4. වීඩියෝකරණය:

හොරයිසන් ලංකා ආයතනය මඟින් වීඩියෝකරණ සහ වීඩියෝ සංස්කරණ කටයුතු සිදු කෙරේ.

5. ලිපි ලේඛන කටයුතු:

MS-Office පුහුණුව දීම මඟින් හොරයිසන් ලංකා 'ඊ-ගම්මාන' වැඩසටහන ලිපි ලේඛන යතුරු ලියනය කිරීම, Powerpoint මඟින් කෙරෙන ඉදිරිපත් කිරීම් වැනි දේ සඳහා පුහුණුව ලබා දෙයි. මේ මඟින් රැකියා අවස්ථා බිහිකිරීම සහ ලිපිලේඛන ආශ්‍රිත ව්‍යාපාර කරන්නවුනට උදවු උපකාර කිරීමට ආයතනයට හැකි වී ඇත.

5. වෙබ් අඩවි සහ ග්‍රැෆික් නිර්මාණ:

විදේශීය ආයතනවලට ඇවැසි පරිදි වෙබ් අඩවි සහ ග්‍රැෆික් නිර්මාණය කිරීමට ශිල්පීන් බිහි කිරීමට හොරයිසන් ලංකා ආයතනයට හැකි වී ඇත.

ආසියා-ශාන්තිකර සංවර්ධන තොරතුරු වැඩසටහන ( Asia Pacific Development Information Programme ) සහ එන්ටර්ප්‍රයිස් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ් ( Enterprise Technologies PVY LTD. ) යන ආයතනවල උදවු සහිතව මෙෂ් තාක්ෂයේ ප්‍රතිලාභ විඳින ප්‍රථම ගම්මානය බවට පත්වීමට මහවිලච්චියට හැකි විය. තම නිවසේ සිටම අන්තර්ජාලයට සම්බන්ධ වීමට අවස්ථාව මෙෂ් තාක්ෂණය මඟි මේ ගැමියනට හිමි කර දී ඇත. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මෙහි පහසුකම් සලසන්නා ලෙස ක්‍රියා කළේ ය. හොරයිසන් ලංකා ආයතනය මේ වනවිට පාවිච්චි කළ පරිගණක 100 ක් පමණ මහවිලච්චියේ පවුල්වලට ලබා දී ඇත. හොරයිසන් ලංකා ආයතනයට ඇති අත්දැකීම් සහ පළපුරුද්ද භාවිත කර අනෙකුත් ග්‍රාමීය ප්‍රජාවනට තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීමට අපට දායක විය හැක. ආයතනය එවැනි වැඩසටහන්වලට උපදේශන සේවා ලබා දෙයි. හොරයිසන් ලංකා ආයතනයට සමාන තවත් වැඩසටහන් දැන් රට පුරා ද ක්‍රියාත්මන වෙයි.

හොරයිසන් ලංකා සහ එහි සේවා පිළිබඳ වැඩිමනත් තොරතුරු http://evillage.wordpress.com වෙතින් ලබා ගත හැකි ය.



ගෙදර සිට මතොරතුරු සෙවීම



හොරයිසන් ලංකා ගුරු ගෙදරට